# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION

සුහුරුපාය, බත්තරමුල්ල


| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1752 / 2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திக<br>Date | 25/11/2024<br>පැය 0700 |

**මාධ්‍ය නිවේදනය**

**බදුල්ල බිබිල මාර්ගයේ රථවාහන ගමනා ගමනය සීමා කිරීම - පස්සර පොලිස් වසම.**

2024.11.18 වන දින පස්සර පොලිස් වසමේ පේරාදෙණිය වෙංකලාඩි (බදුල්ල බිබිල මාර්ගය) A-5 මාර්ගයේ පස්සර පොලිස් වසමේ 143 හා 144 කිලෝමීටර් කණු අතර ප්‍රදේශයේ මාර්ගයට ඉහලින් ඇති කන්ද නායයාම හේතුවෙන් රථවාහන ගමනා ගමනය නවතා තිබුණි.

2024.11.24 වන දින ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනයේ හා මාර්ග සංවර්ධන අධිකාරියේ විධායක ඉංජිනේරුවරයා විසින් එම ස්ථානය පරික්ෂාවට ලක් කර ඇත. ඒ අනුව ලබා දුන් නිර්දේශ අනුව අදාල මාර්ගය **2024.11.25 වන අද දින උදෑසන 0630 සිට සවස 0600 දක්වා රථවාහන ගමනාගමනය සඳහා විවෘත කරන අතර සවස 0600 සිට 2024.11.26 වන දින උදෑසන 0600 දක්වා මාර්ගය වසා තැබීමට නියමිතව ඇත.**

පවතින කාලගුණික තත්ත්වයන් අනුව මාර්ගය විවෘත කරනු ලබන වේලාවන් වෙනස් විය හැකි බවට වැඩිදුරටත් දැනුම් දී ඇති අතර අදාල ස්ථානයේ ආරක්ෂාව හා රථවාහන හැසිරවීමේ රාජකාරි සඳහා පස්සර පොලිස් ස්ථානයේ නිලධාරීන් යොදවා ඇත.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**